www.agaram.lk

NALANDA VIDYALAYA COLOMBO 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

NALANDA VIDYALAYA COLOMBO 10

| 10 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය | ඒකකය 11: පැරණි ජීවනෝපාය ක්‍රම හා බැඳුණු සිරිත් විරිත් |
|---|---|---|

**සැ.යු. පාඩම කීපවරක් අවධානයෙන් කියවන්න.**

01. පැරණි ජීවනෝපාය ක්‍රම ත්‍රිත්වය පාඩමට අනුව ලියා දක්වන්න.
02. වී ගොවිතැන හා සම්බන්ධ ''දියවර මංගල්‍යය'' යන්න ඔබේ වචනයෙන් හඳුන්වන්න.
03. කෙත හැඳින්වීම සඳහා වූ පර්යාය පද ගොනුව ලියා දක්වන්න.
04. වී ගොවිතැන හා සම්බන්ධ ''අත්තම්'' ක්‍රමය පිළිබඳ ඔබේ අදහස කෙටියෙන් ලියන්න.
05. ගොයම් ''කයිය'' යන්න හැඳින්වීමක් කරන්න.
06. කයියට පැමිණෙන අයට ආහාර පිළියෙල කරන්නේ කවු ද? එය හඳුන්වන්නේ කිනම් නමකින් ද? ඒ සඳහා භාවිත අනෙක් නම් ලැයිස්තුගත කරන්න.
07. කමත හෙවත් ''කලවිට'' සඳහා භාවිත අපකරණ හා සතුන් වෙත ආරෝපණය කළ නම් ලියා දක්වන්න.
08. පළිබෝධකයින්ගෙන් වගාව ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ අවිහිංසා ක්‍රියාදාම පෙළගස්වන්න.
09. ගොවියා තීරණය කළ සතියේ සුබ හා අසුබ දවස් වෙන වෙන ම සටහන් කරන්න.
10. කෘෂිකාර්මික නොවන වෘත්තීන් හා විහාරස්ථාන සම්බන්ධයෙන් ගොවියා කෙසේ ක්‍රියාකාරී වී ඇද්ද?
11. ''අලුත් සහල් පූජාව'' යන්න සරල ව පහදන්න.
12. එම පූජාව පවත්වන සිද්ධස්ථාන කීපයක් නම් කරන්න.
13. සුබ වේලාව ගැන සඳහන් (පිටු අංක 83) කවිය කටපාඩම් කර ගන්න.
14. හේන් ගොවිතැන ගැන සඳහන් ග්‍රාම නාම කීපයක් නම් කරන්න.
15. හේන යන වචනය සඳහා අර්ථකථනයක් නිර්මාණය කරන්න.
16. හේන් ගොවිතැනේදී සැලකිලිමත් වන කරුණු මොනවා ද?
17. හේන් ගොවියා හේන සකස් කිරීම සම්බන්ධ ක්‍රියා දාමය නිර්මාණශීලී අදහසක් මඟින් දක්වන්න.
18. හේන ගිනි තැබීම සම්බන්ධ චාරිත්‍රය කෙසේ සිදුවන්නේදැයි දක්වන්න.
19. හේන් ගොවිතැන සම්බන්ධ පිටු අංක ''85'' තුළ වූ කවි පාඩම් කර ගන්න.
20. හේන් ගොවිතැන හා සම්බන්ධ ''අක්වැස්ස'' යන්නෙන් හඳුන්වන්නේ කුමක් ද?
21. හේනක් තුළ රෝපණය වන බීජ කිපයක් නම් කරන්න.
22. හේන් ගොවිතැන හා සම්බන්ධ ''මහඑකා'' යනු කවරෙක්ද?
23. ''මහඑකා'' වළක්වා ගැනීමට ගැමියා කළ කී දේ මොනවා ද?
24. මැටි කර්මාන්තය හඳුන්වන ඉපැරණි ශාස්ත්‍රීය නම ලියා දක්වන්න.
25. මෙරට ඉපැරණිතම මැටි බඳුන් හමුවීම සම්බන්ධ ඓතිහාසික තොරතුරු ලියා දක්වන්න.
26. මැටි කර්මාන්තය හා සම්බන්ධ තොරතුරු සොයා ගැනීමට අදාළ මූලාශ්‍ර නම් කරන්න.
27. මැටි කර්මාන්තයේ ආරම්භය සම්බන්ධ ජනප්‍රවාද තොරතුර ලියා දක්වන්න.
28. මැටි හාරා ගැනීම සම්බන්ධ චාරිත්‍ර කෙටියෙන් විස්තර කරන්න.
29. මැටි කර්මාන්තයට අදළ ජන කවි දෙක කටපාඩම් කර ගන්න. (පිටුව 87)
30. මැටි කර්මාන්ත කරුවන්ගේ විවාහ චාරිත්‍රය සම්බන්ධ කෙටි විස්තරයක් ඉදිරිපත් කරන්න.
31. මැටි කර්මාන්ත කරුවාට කුළුඳුල් දරුවකු උපන් අවස්ථාවේ සිදුවන චාරිත්‍රය ගැන කෙටි විස්තරයක් සපයන්න.
32. මැටි කර්මාන්තකරුවා සිය රෝගාබාධ අවස්ථාවේ ක්‍රියා කළ අන්දම විස්තර කරන්න.
33. පාඩම හා සම්බන්ධ අවබෝධ අභ්‍යාසය සම්පූර්ණ කරන්න.
34. පහත සඳහන් මාතෘකා සම්බන්ධ කර ගනිමින් කෙටි සටහනක් ලියා දක්වන්න.
    - i) වී ගොවිතැන හා සම්බන්ධ සිරිත් විරිත්.
    - ii) සාම්ප්‍රදායික ජීවනෝපායන්හි පරිසර හිතකාමී බව.
    - iii) පැරණි ජීවනෝපායන් බොහෝ විට ආගමික ඉගැන්වීම් අනුව සකස් වී ඇත.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!